# 2013 වර්ෂය සඳහා

# කාර්යසාධන වාර්තාව

# සහ

# වාර්ෂික ගිණුම්

# වාණිජ දෙපාර්තමේන්තුව

# 295 වන ශීර්ෂය

*4වන මහල, රක්ෂණ මන්දිරය,*
*අංක.21, චොක්ෂෝල් වීදිය,*
*කොළඹ 02*
*දුරකථන: 011- 232 9733 / 243 6114*
*ෆැක්ස්: 011 -243 0233*
*විද්‍යුත් තැපැල: fortrade@doc.gov.lk*
*වෙබ් අඩවිය :www.doc.gov.lk*

# <u>පටුන</u>


| | | පිටුව |
|---|---|---|
| ***1*** | *හැඳින්වීම* | ***03*** |
| ***2*** | *2013 වර්ෂයේ ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම පිළිබඳ සමාලෝචනය* | ***04*** |
| ***3*** | *ද්විපාර්ශ්වික වෙළඳාම සහ ආර්ථික සහයෝගීතාව* | ***05*** |
| ***4*** | *වෙළඳ, ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කොමිෂන් සභා* | ***08*** |
| ***5*** | *බහුපාර්ශ්වික වෙළඳ සම්බන්ධතා* | ***09*** |
| ***6*** | *කලාපීය ආර්ථික සහයෝගීතාව* | ***11*** |
| ***7*** | *වෙළඳ, ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධනය* | ***17*** |
| ***8*** | *ප්‍රභවස්ථාන සහතික නිකුත්කිරීම* | ***19*** |
| ***9*** | *කාර්ය මණ්ඩල සංචලන* | ***22*** |
| ***10*** | මූල්‍ය ප්‍රකාශය | ***25*** |


*******************************************

# 1.0 හැඳින්වීම

*දෙපාර්තමේන්තුවේ මෙහෙවර*

> *"සමස්ත නිෂ්පාදන, ආදායම් සහ වෘත්තීය මට්ටම් දියුණු කිරීම තුළින් ජීවන තත්ත්වය නංවාලීම සහ ඉහළ ජීවන තත්ත්වයක් ළඟාකර ගැනීම මගින් ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික වර්ධනය සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදීමේ අරමුණින් යුතුව, රජයේ වෙළඳ ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතා ද්විපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික මට්ටම්වලින් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම."*

කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන වාණිජ දෙපාර්තමේන්තුව විසින් ද්විපාර්ශ්වික, කලාපීය සහ බහු පාර්ශ්වික මට්ටමින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතාවල සමස්ත පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. මෙම තත්වය මත වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන කාර්යභාරයට වෙළඳ ප්‍රතිපත්ති සහ ප්‍රවර්ධනයට අදාළ කාර්යයන් ඇතුළත් වේ. පහත සාරාංශ කරනු ලැබ ඇති දෑ වාණිජ දෙපාර්තමේන්තුව විසින් එලෙස ඉටුකරනු ලබන පුළුල් කාර්ය ක්ෂේත්‍රයන් වේ.

- අදාළ රේඛීය අමාත්‍යාංශ / අධිකාරීන් සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන්ගේ සමීප සහයෝගීතාවයෙන් යුතුව ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- රටෙහි අපේක්ෂිත සමස්ත සංවර්ධනය පිළිබඳ විශේෂ අවධානයක් සහිතව විදේශ වෙළඳ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය වෙත උපදෙස් ලබාදීම.
- විදේශ වෙළඳ නියෝජනය මගින් වෙළඳාම, ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය යන ක්ෂේත්‍රයන් පිළිබඳ ශ්‍රී ලංකාවේ වාණිජමය අභිලාශයෙන් ප්‍රවර්ධනය කිරීම.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී, වාණිජ දෙපාර්තමේන්තුව විසින් විදේශ වෙළඳාම පිළිබඳ රජයේ දැක්ම සහ රටෙහි සමස්ත ආර්ථික සංවර්ධනය කෙරෙහි දැක්විය හැකි මුඛ්‍ය දායකත්වය මත පදනම් ව එහි කාර්ය වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබීය. මෙලෙස, 2013 වසරේ කාර්ය වැඩසටහන මගින්, අනෙකුත් කාර්යයන් අතර, පවත්නා වෙළඳ සීමා තවදුරටත් ශක්තිමත් කිරීම, නව වෙළඳපළ සොයා ගැනීම, නව නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම, ජාත්‍යන්තර වෙළඳාම් ක්‍රමයට ඵලදායී ලෙස සහභාගීවීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME) අංශය දිරිගැන්වීම සහ දකුණු ආසියානු කලාපයේ වෙළඳ මූලස්ථානයක් වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම කෙරෙහි ද අවධානය යොමු කර ඇත. වාණිජ දෙපාර්තමේන්තුව විසින් එහි විදේශ වෙළඳ නියෝජනය මගින්, සෘජු විදේශ ආයෝජන සහ ආයෝජන කළඹක් මෙන්ම ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයද ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම සහ සහාය ද ලබාදෙන ලදී.

## 2.0 2013 වර්ෂයේ ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම පිළිබඳ සමාලෝචනය

### 2.1 අපනයන සහ ආනයන කාර්ය සාධනය

ශ්‍රී ලංකා රේගු දත්ත අනුව, 2012 වසරේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 9,181ක් වූ ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන ඉපැයුම්, 2013 වර්ෂය තුළදී 9.0%ක වර්ධනයක් සනිටුහන් කරමින් ඇමෙරිකානු ඩොලර් මිලියන 10,009 ක් දක්වා වැඩිවී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ දත්ත අනුව, කාර්මික සහ කෘෂිකාර්මික යන අංශ දෙකෙහි අපනයන ඉපැයුම් 6.5%ක වැඩිවීමක් වාර්තා කරන ලදී. 2012 වර්ෂය හා සැසඳීමේදී, කෘෂිකාර්මික අපනයන තොගයට ඇතුළත් වූ තේ අපනයන ඉපැයුම් 9.2%ක වර්ධනයක් සනිටුහන් කරමින් ඇමෙරිකානු ඩොලර් මිලියන 1,542ක් වූ අතර රබර් අපනයන ඉපැයුම් 43.2%ක අඩුවීමක් වාර්තා කරන ලදී.

2013 වසරේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 7,749ක් වූ කාර්මික නිෂ්පාදන අපනයන පසුගිය වර්ෂයට සාපේක්ෂව 5.1%ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. රෙදි පිළි සහ ඇඟළුම් අංශය මගින් සමස්ත අපනයන ඉපැයුම් සඳහා විශාලතම දායකත්වය ලබාදෙන ලද අතර එම ප්‍රමාණය 43.4%ක් විය. 2012 වසරේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 3,991 ක් වූ ඇඟළුම් අපනයන 2013 වසරේදී 12.95%ක වර්ධනයක් වාර්තා කරමින් ඇමෙරිකානු ඩොලර් මිලියන 4,508 ක් දක්වා වැඩිවී ඇත. රබර් ආශ්‍රිත නිෂ්පාදන සහ මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, කාර්මික අපනයන සඳහා පිළිවෙළින් දෙවන සහ තෙවන විශාලතම දායකත්වයන් වේ.

**ශ්‍රී ලංකාවේ මුළු ආනයන, අපනයන සහ වෙළඳ ශේෂය : 2009 - 2013**


**(වටිනාකම: ඇමෙරිකානු ඩොලර් මිලියන)**

**(වගු අංක 01)**

| වර්ෂය | අපනයන | වර්ධන ප්‍රතිශතය | ආනයන | වර්ධන ප්‍රතිශතය | මුළු වෙළඳාම | වෙළඳ ශේෂය |
|---|---|---|---|---|---|---|
| 2009 | 7,118 | - 13.0 | 9,767 | - 28.0 | 16,885 | -2,648 |
| 2010 | 8,294 | 16.5 | 12,340 | 26.4 | 20,634 | -4,047 |
| 2011 | 10,018 | 20.8 | 19,703 | 59.7 | 29,721 | -9,685 |
| 2012 | 9,181 | -8.4 | 17,889 | -9.2 | 27,069 | -8,708 |
| 2013 | 10,009 | 9.0 | 17,098 | -4.4 | 27,107 | -7,088 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව

**ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ දිශාව 2013**




## 3.0 ද්විපාර්ශ්වික වෙළඳ සහ ආර්ථික සහයෝගීතාව

2013 වසරේදී, ශ්‍රී ලංකාව විසින් ප්‍රධාන වෙළෙඳ පාර්ශවකරුවන් සමඟ මෙන්ම ශ්‍රී ලංකාව සමඟ වෙළෙඳ කටයුතු සිදුකරනු ලබන අනෙකුත් රටවල් සමඟද ද්විපාර්ශ්වික වෙළෙඳ හා ආර්ථික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් දැඩි විමසිල්ලකින් හා අවධාරණයකින් යුතුව කටයුතු කරන ලදී. ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය, චීනය, ඉන්දියාව, පාකිස්ථානය, ජපානය, රුසියාව සහ පැරණි සෝවියට් සංගමයේ රටවල්, අප්‍රිකානු සහ මැද පෙරදිග කලාපය සමඟ වෙළෙඳ හා ආර්ථික සබඳතා මේ සම්බන්ධයෙන් ප්‍රධාන වී ඇත. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී, ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව හා පාකිස්ථානය සමඟ අත්සන් තබන ලද ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් (FTA) යටතේ සහ චීනය සමඟ යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම් (FTA) යටතේ වාණිජමය ප්‍රතිලාභ වැඩිදියුණු කරගැනීම පිළිබඳව සමාන වැදගත්කමක් දක්වන ලදී.

### 3.1 ඉන්දු -ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම

1998 දෙසැම්බර් 28 වන දින අත්සන් තබන ලද, 2000 මාර්තු මස 01වන දින සිට ක්‍රියාත්මක ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) මගින් දෙරට අතර වෙළඳාම් වන පුළුල් නිෂ්පාදන පරාසයක් සඳහා තීරුබදුවලින් නිදහස්වීමේ සහන සැලසේ. ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම 2008 නොවැම්බර් මාසයේ සිට පූර්ණ වශයෙන් ක්‍රියාත්මකවී ඇති අතර එමඟින්, තීරුබදු සීමා 4000කට අධික ප්‍රමාණයක්

යටතට ගැනෙන නිෂ්පාදන තීරුබදුවලින් නිදහස් පදනම මත ඉන්දියානු වෙළඳපොළ වෙත අපනයනය කිරීමේ හැකියාව ශ්‍රී ලංකාව වෙත ලැබී ඇත.

2013 වසරේදී, ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව වෙත කරන ලද මුළු අපනයනවල වටිනාකම 4%ක අඩුවීමක් සනිටුහන් කරමින් ඇ.ඩො. මිලියන 543.3ක් වූ අතර ඉන්දියාවෙන් ශ්‍රී ලංකාව වෙත කරන ලද මුළු ආනයනවල වටිනාකම 12%ක අඩුවීමක් සනිටුහන් කරමින් ඇ.ඩො. මිලියන 3092.6ක් විය. මෙම වර්ෂයේදී දෙරට අතර සමස්ත වෙළඳාම පෙර වර්ෂය හා සැසඳීමේදී 11%ක අඩුවීමක් සහිතව ඇ.ඩො. මිලියන 3636.0ක් වාර්තා කරන ලද අතර එය ඇ.ඩො. මිලියන 2549.3ක අහිතකර වෙළඳ ශේෂයක් ඇතිවීම කෙරෙහි බලපා ඇත. 2013 වසරේදී, ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව වෙත කරන ලද මුළු අපනයනයන්ගෙන් 65%කට අධික ප්‍රමාණයක් ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) යටතේ තීරුබදු සහන භුක්ති විඳින ලද අතර ඉන්දියාවෙන් ශ්‍රී ලංකාව වෙත කරන ලද ආනයනයන්ගෙන් සැලකියයුතු ප්‍රමාණයක් ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ පවත්නා තීරුබදු විෂය සීමාවෙන් පරිබාහිරව සිදුවන බව පෙන්නුම් කරමින් ඉන්දියාවෙන් ශ්‍රී ලංකාව වෙත කරන ලද මුළු ආනයනයන්ගෙන් 15%ක් පමණක් ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තීරුබදු සහන භුක්ති විඳින ලදී. මෝටර් රථ සහ ඛණිජ තෙල් නිෂ්පාදන, යකඩ හෝ වානේ සහ එම උපාංග, ඖෂධ, සීනි සහ සිමෙන්ති ඇතුළත් අනෙකුත් වෙළඳ භාණ්ඩ වැනි ඉහළ වටිනාකමක් ඇති අයිතමයන් මෙයට ඇතුළත් වේ. 2013 වසරේදී ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලැබ ඇති මුළු ප්‍රභවස්ථාන සහතික (COOs) සංඛ්‍යාව 11,088කි. මෙය, 2012 වසරේදී නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතික 9,743 හා සසඳන විට, 13.8%ක වැඩිවීමක් වාර්තා කෙරේ.

ඉන්දියා - ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිසමේ අට වැනි සැසිවාරය 2013 ජනවාරි 22 දින ඉන්දියාවේ නව දිල්ලි හිදී පවත්වන ලදී. මෙම රැස්වීමේදී, අනෙකුත් දෑ අතර, දෙරට අතර වෙළඳ සහ ආයෝජන සබඳතා පුළුල් කිරීම සඳහා ඒකාබද්ධ කාර්ය සාධන බලකායක් ස්ථාපිත කිරීම, ශ්‍රී ලංකාවේ අපනයන ධාරිතාව වැඩි කිරීම උදෙසා කටයුතු කිරීම සහ විස්තීර්ණ හා තිරසාර ආර්ථික සහයෝගීතාවක් ඇති කිරීම සඳහා විශේෂ ආර්ථික හවුලක් ගොඩනැගීම උදෙසා දැඩි උපදේශනයන් ලබාගැනීම යනාදිය සඳහා දෙපාර්ශ්වය විසින් එකඟවන ලදී.

2013 ජුනි 24 සිට 25 දක්වා කොළඹදී පවත්වන ලද වාණිජ ලේකම් මට්ටමේ රැස්වීම අතරතුරදී, ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ විසඳීමට ඇති ගැටළු කිහිපයක් පිළිබඳව සාකච්ඡා කරන ලද අතර දෙරට අතර වෙළඳාම පුළුල් කිරීමේ වැදගත්කම අවධාරණය කරන ලදී. ඉන්දියාව විසින්, මුළු සලාකය කොන්දේසි රහිතව තීරුබදු වලින් නිදහස් කරමින් මුළු ඇඟලුම් කෑබලි මිලියන 8න් ඉතිරිවන ඇඟලුම් කැබලි මිලියන 5 මත රෙදිපිළි ලබාගැනීමේ කොන්දේසිය ඉවත් කරන ලදී. මුල් කාලයේදී, ඇඟලුම් කැබලි මිලියන 5ක් සඳහා මෙම කොන්දේසිය අදාළ විය. ශ්‍රී ලංකාවෙන් සැකසූ මස් සහ පළතුරු ආනයනය මත පනවන ලද සීමාවන් ඉවත් කර ඇති බවද ඉන්දියානු පාර්ශ්වය විසින් දැනුම්දෙන ලදී.

2013 ජුනි මස 24 වන දින පවත්වන ලද ඉංදියා - ශ්‍රී ලංකා ඒකාබද්ධ කාර්ය සාධන බලකායේ පළමු රැස්වීමේදී, ද්විපාර්ශ්වික වෙළඳාම සහ ආයෝජනය තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින් යුතුව නව ප්‍රවේශ මාර්ග සොයා බැලීමට දෙපාර්ශ්වය විසින් එකඟවන ලදී. මෙම රැස්වීමේදී, ඒකාබද්ධ කාර්ය සාධන බලකාය විසින් සංචාරකයින්ගේ පැමිණීම වැඩි කිරීම අවශ්‍ය ක්‍රියාමාර්ග පිළිබඳවද සාකච්ඡා කරන ලදී.

ඉන්දියාව සමඟ ද්විපාර්ශ්වික වෙළඳ සාකච්ඡා පැවැත්වෙන අතරතුරදී ශ්‍රී ලංකාවට පැවරෙන ලද එකඟවූ බැඳීම් ක්‍රියාවට නංවමින්, 2013 නොවැම්බර් මාසයේදී, ශ්‍රී ලංකාව විසින් 2014 අයවැය මඟින් ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ පවත්නා තම ඍණාත්මක අයිතම ලැයිස්තුවෙන් අයිතම දහයක් (10) ඉවත් කරගන්නා ලදී.

### 3.2 පාකිස්ථාන – ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම

පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) 2005 ජුනි මස 12 වන දින විට බලාත්මක වන පරිදි ක්‍රියාත්මක වීමත් සමඟ ශ්‍රී ලංකාව සහ පාකිස්ථානය අතර වෙළඳාමෙහි සැළකියයුතු වර්ධනයක් වාර්තා වී ඇත. පාකිස්ථානය, සාර්ක් කලාපය තුළ ඉන්දියාවට පසුව ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම වෙළඳ හවුල්කරු වේ. ගම්මිරිස්, එළවළු නිෂ්පාදන, බීඩි කොළ, බුලත් කොළ, පොල්කටු කැබලි, ස්වාභාවික රබර්, පොල් සහ අමු හෝ වියලි කජු යනාදිය පාකිස්ථානය වෙත ශ්‍රී ලංකාව විසින් සිදු කරනු ලබන ප්‍රධාන අපනයනයන්ට ඇතුළත් වේ. පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ක්‍රියාත්මක වීමෙන් අනතුරුව නව නිෂ්පාදන පෙළක්ද පාකිස්ථාන වෙළඳපළ වෙත අවතීර්ණ වී ඇත. ඇඟළුම්, එම්ඩීඑෆ් පුවරු, විස්කෝතු, නැවුම් අන්නාසි, ක්‍රීඩා භාණ්ඩ, ඇට සහිත සියඹලා, බාදා තෙල්, පෝසිලේන් පිඟන් භාණ්ඩ සහ මුළුතැන්ගෙයි උපකරණ, පිඟන් ගඩොල්, ගෘහභාණ්ඩ, තීන්ත, වීදුරු පින්තාරු, සම් භාණ්ඩ, සීතකළ මාළු, ඉස්සෝ, පොකිරිස්සෝ, කකුළුවෝ, කැපූ මල් සහ විසිතුරු පත්‍ර, මැණික් හා ස්වර්ණාභරණ සහ සුරතල් මසුන් යනාදී අයිතමයන් මෙම නව නිෂ්පාදනයන්ට ඇතුළත් වේ.

2004 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 147ක් වූ දෙරට අතර මුළු වෙළඳ වටිනාකම 2013 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 462.12ක් දක්වා වැඩිවී ඇත. 2004 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 39ක් වූ පාකිස්ථානය වෙත ශ්‍රී ලංකාවේ අපනයන 2013 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 83.05ක් දක්වා වැඩිවී ඇත.

### 3.3 චීනය සහ ශ්‍රී ලංකාව අතර යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA)

ශ්‍රී ලංකාව සහ චීනය අතර වෙළඳ සබඳතා ශත වර්ෂ ගණනාවක් කරා ආපසු දිවෙන දිගු ඉතිහාසයක් පුරා විහිද යයි. රබර් සහ සහල් ගිවිසුම අත්සන් කිරීමත් සමඟ, 1952 වර්ෂයෙන් ආරම්භවන කාල පරිච්ඡේදය දෙරට අතර වෙළඳ සබඳතා සම්බන්ධයෙන් නව පරිච්ඡේදයක් ආරම්භ කරන ලදී. අනතුරුව, අපනයන සහ ආනයන නිෂ්පාදන සඳහා MFN (Most Favoured Nation) පිළියම ලබාදෙමින් දෙරට අතර සාමාන්‍ය ස්වභාවයේ වෙළඳ ගිවිසුමක් අත්සන් කරන ලදී. දෙරට අතර ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ ගිවිසුම් පිළිවෙළින් 1982 සහ 1984 යන වර්ෂයන්හිදී අත්සන් කරන ලදී. 1991 වර්ෂයේදී ඉහත සඳහන් ගිවිසුම් දෙක වෙළඳ සහ ආර්ථික සහයෝගීතාව පිළිබඳ ශ්‍රී ලංකා - චීන ඒකාබද්ධ කමිටුව වෙත ඒකාබද්ධ කරන ලද අතර එහි පළමු සැසිවාරය 1992 මාර්තු මාසයේදී කොළඹදී පවත්වන ලදී. 2013 අප්‍රේල් 24 වන දින කොළඹදී පවත්වන ලද එහි පස්වැනි සැසිවාරයේදී, වෙළඳ, ආර්ථික සහයෝගීතාව සහ සංචාරක විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සහ චීනය අතර ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා මුඛ්‍ය තීරණ ගණනාවකට එළඹෙන ලදී. එහිදී ගන්නා ලද විශේෂ තීරණයක් වූයේ, දෙරට අතර වරණීය වෙළඳ ගිවිසුමක් (PTA) අත්සන් කිරීමයි.

අනතුරුව, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ චීන රාජ්‍ය සංචාරය අතරතුරදී 2013 මැයි මස 27 වන දින දෙරට අතර වෙළඳ සහ ආර්ථික සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද අතර එහිදී, චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමක ශක්‍යතාව සහ වෙළඳ ශේෂය ඉහළ නංවමින් ශ්‍රී ලංකාව විසින් චීනය වෙත කරනු ලබන අපනයන පුළුල් කිරීමේ ගැටළු අධ්‍යයනය කිරීම සඳහා වෙළඳාම පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමක් පිහිටුවීමට එකඟවන ලදී. 2013 ඔක්තෝබර් මාසයේදී පවත්වන ලද රැස්වීමකදී ගන්නා ලද තීරණයක් අනුව, දෙපාර්ශ්වය විසින් ඒකාබද්ධ ශක්‍යතා අධ්‍යයන වාර්තා සම්පාදනය කරන ලද අතර අනතුරුව, දෙරට අතර නිදහස් වෙළඳ ගිවිසුමක් අත්සන් කිරීම සඳහා නිර්දේශයක් සහිතව ඒකාබද්ධ වාර්තාවක් වර්ෂය තුළදී ඉදිරිපත් කරන ලදී.

## 4.0 වෙළඳ, ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කොමිෂන් සභා

පහත සඳහන් ද්විපාර්ශ්වික ඒකාබද්ධ කොමිෂන් සභා / කමිටු කැඳවීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පවත්නා ප්‍රධානතම ආයතනය වන්නේ වාණිජ දෙපාර්තමේන්තුවයි.

- ශ්‍රී ලංකාව - බංග්ලාදේශය
- ශ්‍රී ලංකාව - ඊජිප්තුව
- ශ්‍රී ලංකාව - ඉරානය
- ශ්‍රී ලංකාව - මාලදිවයින
- ශ්‍රී ලංකාව - ඉරාකය
- ශ්‍රී ලංකාව - බෙලරුස්
- ශ්‍රී ලංකාව - චීනය
- ශ්‍රී ලංකාව - ඉන්දියාව
- ශ්‍රී ලංකාව - කුවේටය
- ශ්‍රී ලංකාව - පාකිස්ථානය
- ශ්‍රී ලංකාව - තායිලන්තය

### 4.1 පාකිස්ථාන – ශ්‍රී ලංකා ඒකාබද්ධ ආර්ථික කොමිසමේ 11වැනි සැසිවාරය

පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) පිළිබඳ තාක්ෂණික මට්ටමේ 5වැනි සභාවාරය 2013 අප්‍රේල් 28 -29 දිනයන්හිදී ඉස්ලාමාබාද් හිදී පවත්වන ලද අතර ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශයේ ලේකම් සහ පාකිස්ථානයේ වාණිජ ලේකම් දූත පිරිස්හි නායකත්වය දරන ලදහ.

ඉහත සඳහන් රැස්වීම අතරතුරදී, පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ විසඳීමට ඇති ගැටළු කිහිපයක් පිළිබඳව සාකච්ඡා කරන ලද අතර, මදුරු දඟර (Mosquito repellent coils), බෝතල් සිසිල්කරණ යන්ත්‍ර, අමු පොල් තෙල්, බුලත් කොළ සහ ශාකසාර රූපලාවන්‍ය නිෂ්පාදන වැනි නිෂ්පාදන පහක් සඳහා වෙළඳපළ ප්‍රවේශයක් ලබාගැනීමට ශ්‍රී ලංකාවට හැකියාව ලැබුණි. තවද, ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන ජින්ජර් බියර් සහ සෙරමික් නිෂ්පාදන සඳහා තීරු බදු සහන ලබාදීම සලකා බැලීමට පාකිස්ථානු පාර්ශ්වය එකඟවී ඇත. ඉදිරි සාකච්ඡා සම්මුති සඳහා පහසුකම් සලසාලනු වස්, භාණ්ඩ වෙළඳාම, රේගු සහයෝගීතාව, ආයෝජනය සහ මෝටර් රථ ක්ෂේත්‍රය (Auto Sector) පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම් (Joint Working Groups) පිහිටුවීමට ද සාකච්ඡාව පැවැත්වෙන අතරතුරදී දෙපාර්ශ්වය එකඟ වී ඇත. තවද, ශ්‍රී ලංකා - පාකිස්ථාන ඒකාබද්ධ ආර්ථික කොමිසමේ 11 වැනි සැසිවාරය 2013 නොවැම්බර් 27 - 28 දිනයන්හිදී ශ්‍රී ලංකාවේ කොළඹදී පවත්වන ලද අතර තාක්ෂණික මට්ටමේ 5වැනි සභාවාරයේදී පැනනැගුන ගැටළු නිරාකරණය කරනු ලැබ ඇත.

### 4.2 ශ්‍රී ලංකාව සහ බෙලරුස් අතර වෙළඳ හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ ගිවිසුම

දෙරට අතර පවත්නා වෙළඳ සහ ආර්ථික සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, ශ්‍රී ලංකාව සහ බෙලරුස් අතර ද්විපාර්ශ්වික වෙළඳ සහ ආර්ථික සහයෝගීතා ගිවිසුමක් අත්සන් කිරීමට බෙලරුස් රජය විසින් යෝජනා කරන ලදී. ඒ අනුව, 2013 අගෝස්තු 25 සිට 28 දක්වා ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ බෙලරුස් රාජ්‍ය සංචාරය අතරතුරදී එම ගිවිසුම අත්සන් කරන ලදී.

## 5.0 බහු-පාර්ශ්වික වෙළඳ සම්බන්ධතා

ශ්‍රී ලංකාවේ බහු පාර්ශ්වික වෙළෙඳ සම්බන්ධතා මගින් ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) ගිවිසුම් කෙරෙහි මූලික වශයෙන් අවධානය යොමු කරනු ලබයි. ශ්‍රී ලංකාව විසින්, වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD), ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) සහ ලෝක වෙළඳ සංවිධාන නීතිය පිළිබඳ උපදේශක මධ්‍යස්ථානය (ACWL) ඇතුළත් වෙනත් බහු පාර්ශ්වීය සංවිධාන කිහිපයක් සමඟ සමීප සහසම්බන්ධතාවක් ද පවත්වාගෙන යනු ලැබේ.

### 5.1 ලෝක වෙළඳ සංවිධානය (WTO)

2013 දෙසැම්බර් මාසයේදී පවත්වන ලද ලෝක වෙළඳ සංවිධානයේ 9වැනි අමාත්‍ය සමුළුව අතරතුරදී සාමාජික රාජ්‍යයන් විසින් වෙළඳාම් පහසුකරණය, කෘෂිකර්මාන්තය සහ සංවර්ධන ගැටළු යන ක්ෂේත්‍ර සම්බන්ධ තීරණ ගණනාවකින් සමන්විත "බාලි පැකේජය" සම්මත කරගන්නා ලදී. මෙම බාලි පැකේජය මගින්, 1995 වර්ෂයේදී ලෝක වෙළඳ සංවිධානය ස්ථාපිත කරන ලද දා සිට සාමාජික රාජ්‍යයන් විසින් සම්මත කරගන්නා ලද පළමු වෙළෙඳ පැකේජය සනිටුහන් කරන ලදී. විශේෂයෙන්, මෙහිලා ඉතා වැදගත් ප්‍රතිඵලය වූයේ, සාමාජික රාජ්‍යයන්හි රේගු කටයුතු සහ ගාස්තු සම්බන්ධයෙන් පවත්නා බැඳීම් පුළුල් කරන්නාවූ දේශ සීමා ක්‍රියාපටිපාටි සහ රෙගුලාසි, විනිවිදභාවය හා සංක්‍රමණ නිදහස ආනුෂංගිකව ඒකාබද්ධකරණය සහ සංවිධිතකරණය ඉලක්ක කරගත් වෙළඳාම් පහසුකරණය (Trade Facilitation) පිළිබඳ ගිවිසුම සහ බහු පාර්ශ්වික ගිවිසුමක කටයුතු සාර්ථක ලෙස නිමාවට පත්කර සම්මත කරගැනීමයි.

කෘෂිකර්මාන්තය කෙරෙහි විශේෂ උනන්දුවක් ඇති සංවර්ධනය වෙමින් පවත්නා රටවල් වන, 33 කණ්ඩායමේ (G-33) රටවල සාමාජිකයෙක් වශයෙන්, ශ්‍රී ලංකාවද කෘෂිකර්මාන්තය තුළ ස්වයං-පෝෂිතභාව ආරක්ෂා කිරීම සහ ඉහළ නැංවීම සඳහා වැඩිදියුණු කරන ලද ප්‍රතිපත්ති අවකාශයක් කරා ගමන් කරමින් සාකච්ඡාවලට සහභාගි වන ලදී. තවද, සහනාධාර ලබාදිය හැකි කෘෂිකාර්මික සේවාවන් පුළුල් කිරීම ඇතුළත්ව සංවර්ධනය වෙමින් පවත්නා රටවල ආහාර සුරක්ෂිතතාව සඳහා ලබාදෙන්නාවූ සහ ආහාර සුරක්ෂිත කටයුතු සඳහා මහජන කොටස් හිමිකම සම්බන්ධයෙන් ලබාදෙන්නාවූ සහාය සඳහා නම්‍යතාවන් ලබාදෙන්නාවූ තීරණද මෙම බාලි පැකේජයට ඇතුළත් වේ. අනෙකුත් තීරණ සම්මත කරගන්නා ලද්දේ, තීරුබදු අනුපාත සලාක පරිපාලනය, අපනයන තරඟකාරීත්වය සහ කපු පිළි සම්බන්ධයෙන්ය.

සංවර්ධන ක්ෂේත්‍රය තුළ, සාමාජික රාජ්‍යයන් විසින් විශේෂ හා ආන්තර විධිවිධාන (S&D provisions) ක්‍රියාත්මක කිරීමේ සියළුම අංගයන් විශ්ලේෂණය කිරීම සහ සමාලෝචනය කිරීම සඳහා ලෝක වෙළඳ සංවිධානය තුළ පවත්නා මූල ලක්ෂ්‍යයක් වශයෙන් ක්‍රියාකළ හැකි, විශේෂ හා ආන්තර පිළියම් (Special and Deferential Treatment) සම්බන්ධයෙන් අධීක්ෂණ යාන්ත්‍රණයක් සම්මත කරගන්නා ලද අතර සමාලෝචනය මගින් ගැටළුවක් හඳුනාගන්නා විට, මෙම යාන්ත්‍රණය මගින්, තාක්ෂණික කටයුතු භාරව ක්‍රියාකරන ලෝක වෙළඳ සංවිධානයේ අදාල ආයතනය වෙත, අවශ්‍ය වන්නේ නම්, සාකච්ඡා ආරම්භ කිරීම ඇතුළත් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය හැක.

ඌන සංවර්ධිත රටවල් (LDCs) සඳහා ලිහිල් කරන ලද ප්‍රභවස්ථාන රීති (Rules of Origin), ඌන සංවර්ධිත රටවල් වෙත තීරුබදු රහිත සලාක රහිත ප්‍රවේශය සහ ඌන සංවර්ධිත රටවල සේවා සැපයුම්කරුවන් සඳහා සේවා ක්ෂේත්‍රය තුළ බැඳීම් බොහොමයක් පිරිනැමට ලෝක වෙළඳ සංවිධානයේ අනෙකුත් සාමාජික රාජ්‍යයන් වෙත අවකාශ ලබාදෙන්නාවූ අත්හැර දැමීමක් ඇතුළත්, ඌන සංවර්ධිත රටවල් සඳහා බලපාන්නාවූ ගැටළු පිළිබඳවද තවදුරටත් තීරණ සම්මත කරගන්නා ලදී.

### 5.2 ගෝලීය වෙළඳ වරණ ක්‍රමය

සංවර්ධනය වෙමින් පවත්නා රටවල් අතර ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP) පිළිබඳ ගිවිසුම 1989 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP) යනු, දකුණ - දකුණ අතර වෙළෙඳාම හා ආර්ථික සහයෝගීතාව වර්ධනය කිරීමේ අරමුණින් වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනයෙහි (UNCTAD) අනුග්‍රහය යටතේ සාකච්ඡා සම්මුතිවලට එළැඹුණු වරණීය තීරුබදු යෝජනා ක්‍රමයකි. මෙම යෝජනා ක්‍රමය යටතේ, වර්ෂය තුළදී මෙක්සිකෝව හා පේරූ යන රාජ්‍යයන් වෙත ශ්‍රී ලංකාව විසින් ඇමෙරිකානු ඩොලර් මිලියන 19.17ක් වටිනා භාණ්ඩ තොගයක් අපනයනය කරන ලැබ ඇත.

### 5.3 වරණීය පොදු ක්‍රමය (GSP)

#### (අ) යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය (EU – GSP) යෝජනා ක්‍රමය

යුරෝපා සංගමයේ පාර්ලිමේන්තුව විසින් 2012 ජූනි 13 වන දින නව GSP යෝජනා ක්‍රමයක් අනුමත කරනු ලැබ ඇති අතර, එය **2014 ජනවාරි 01** දින සිට ක්‍රියාත්මක වන ලදී. ශ්‍රී ලංකාව, 2013 වර්ෂය තුළ අඛණ්ඩව යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමයේ (EU – GSP) පොදු සහන ප්‍රතිලාභියෙකු විය. නිෂ්පාදනයන්හි මිල තරඟකාරී මායිම තියුණු කරන්නාවූ යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමයේ සහන සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන සියල්ලම පාහේ සුදුසුකම් ලබති.

#### (ආ) නෝර්වේ GSP + යෝජනා ක්‍රමය

නෝර්වේ රජය විසින් 2013 ජනවාරි 01 සිට ක්‍රියාත්මක වන පරිදි පහළ මධ්‍යම ආදායම් ලාභී රටවල් සඳහා නව GSP+ ප්‍රවර්ගයක් හඳුන්වා දෙනු ලැබ ඇත. අපනයන වෙළඳපළ පුළුල් කිරීම සහ විවිධාංගීකරණය කිරීමත් සමඟ පහළ මධ්‍යම ආදායම් ලාභී රටවල වර්තමාන තත්වය උසස් කිරීම සඳහා මෙම නව GSP+ පහසුකම හඳුන්වා දෙනු ලැබ ඇත. ශ්‍රී ලංකාව, HS පරිච්ඡේද 61, 62 සහ 63 යටතේ රෙදිපිළි සහ ඇඟලුම් ඇතුළත් නෝර්වේ රාජ්‍යය වෙත අපනයනය කරන්නාවූ සියලුම කාර්මික නිෂ්පාදන

සඳහා තීරුබදු රහිත වෙළඳපළ ප්‍රවේශ පහසුකම භුක්තිවිඳිමින් සිටින අතරතුර, මෙම පහසුකම යටතේ ප්‍රතිලාභ ලැබීම සඳහා හිමිකම් ලබන රටවල් 17 අතර සිටී.

**(ඇ) එක්සත් ජනපද GSP යෝජනා ක්‍රමය**

එක්සත් ජනපද කොන්ග්‍රසය විසින් මෙම යෝජනා ක්‍රමයේ කාල සීමාව දීර්ඝ නොකිරීම හේතුවෙන්, එක්සත් ජනපද GSP වැඩසටහනෙහි කාල සීමාව 2013 ජූලි 31 දින අවසන් විය. එක්සත් ජනපද GSP වැඩසටහනෙහි කාල සීමාව, 1974 වර්ෂයේදී එහි ආරම්භයේ සිට 12 වතාවක් අවසන්වී ඇත. එහෙත්, එක්සත් ජනපද කොන්ග්‍රසය විසින් වරණීය පොදු ක්‍රමය (GSP) අනුමත කළවිට, ආපසු ගෙවීමේ ක්‍රමය මගින් ප්‍රතිපායන පදනම මත වරණීය පොදු ක්‍රමයේ ප්‍රතිලාභ ඉල්ලා සිටීමට එක්සත් ජනපද ආනයනකරුවන්ට හැකියාව ලැබෙනු ඇත.

## 6.0 කලාපීය ආර්ථික සහයෝගීතාව

ශ්‍රී ලංකාව, ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA), දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA), දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA), බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන් (BIMSTEC) සහ ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (IORA) වැනි එහි කලාපීය වෙළෙඳ හා ආර්ථික ගිවිසුම් සම්බන්ධයෙන් ප්‍රධාන භූමිකාවක් රඟදක්වන්නෙකු ලෙස තවදුරටත් කටයුතු කරන ලදී.

### 6.1 ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA)

"බැංකොක් ගිවිසුම" ලෙස මීට පෙර හඳුන්වනු ලැබූ ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුම 2005 නොවැම්බර් 02 දින අත්සන් කරන ලද අතර, 2006 සැප්තැම්බර් 01 දින සිට බලාත්මකව ක්‍රියාත්මක කරන ලදී. ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුමේ ස්ථාවර කමිටුවේ 41 වැනි සහ 42 වැනි සැසිවාරයන් පිළිවෙලින් 2013 ජූනි මාසයේදී සහ 2013 නොවැම්බර් මාසයේදී පවත්වන ලදී. මොන්ගෝලියාව සහ ආසියා -පැසිෆික් වෙළඳ ගිවිසුමේ සියලුම සහභාගීත්ව රාජ්‍යයන් අතර ද්විපාර්ශ්වික සාකච්ඡා සාර්ථක ලෙස නිමාවට පත්කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2013 නොවැම්බර් මාසයේදී මොන්ගෝලියාව නිල වශයෙන් ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුමේ සාමාජිකයෙකු බවට පත්විය. සාමාජික රාජ්‍යයන් විසින්, ආසියා -පැසිෆික් වෙළඳ ගිවිසුමේ අමාත්‍ය සභාවේ 4වැනි සැසිවාරය අතරතුරදී 4වැනි වටයේ සාකච්ඡා අවසන් කිරීමට තීරණය කරනු ලැබ ඇත. ඉතා දිගු සහන ලැයිස්තු මෙන්ම ඉතා පුළුල් වරණීය ආන්තිකයන් නව බැඳීම්වලට ඇතුළත් කිරීමට බලාපොරොත්තු වේ.

චීනය වෙත කරන ලද අපනයන වැඩිවීම හේතුවෙන් ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ අපනයන 2012 වර්ෂයේදී පැවති ඇමෙරිකානු ඩොලර් මිලියන 61.7 සිට 2013 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 75.1ක් දක්වා වර්ධනය විය. කොරියාව වෙත කරන ලද අපනයන 2012 වර්ෂයට සාපේක්ෂව සැළකියයුතු ලාභයක් නොපෙන්වමින්, 2013 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 17ක්ව පැවතුණි. 2013 වර්ෂයේදී ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුම යටතේ චීනය වෙත ශ්‍රී ලංකාවේ අපනයන 2012 වර්ෂයේදී පැවති ඇමෙරිකානු ඩොලර් මිලියන 36.2 සිට ඉහළ නංවමින්

ඇමෙරිකානු ඩොලර් මිලියන 53.9ක් වාර්තා කරන ලදී. කොහු සහ කොහු නිෂ්පාදන විශාලතම අපනයන අයිතමය වශයෙන් පැවති අතර එය මුළු අපනයනයෙන් 42% ක් විය. ඉන් අනතුරුව, තේ, ඇඟලුම්, රබර් සහ රබර් නිෂ්පාදන සහ සක්‍රීය කාබන් පිළිවෙළින් 32%, 17%, 3% සහ 2%ක් වශයෙන් පැවතිණි. ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුම යටතේ කොරියාව වෙත ශ්‍රී ලංකාවේ අපනයන ඇමෙරිකානු ඩොලර් මිලියන 17.1ක් විය. 2012 වර්ෂයේ සිට අපනයනයන්හි වෙනසක් සනිටුහන් නොකරන ලද අතර, 36% ක අපනයන ඇතුළත් රබර් සහ අගය එකතුකළ රබර් නිෂ්පාදන සහ ඇඟලුම් (32%), කොහු සහ කොහු නිෂ්පාදන (11%), සක්‍රීය කාබන් (10%), පාවහන් (4%), තේ (2%) සහ සෙරමික් භාණ්ඩ (2%) සහිතව කොරියාව වෙත අපනයන සංයුතිය, චීනය වෙත අපනයන සංයුතියට වඩා බොහෝ වෙනස්ව පැවතිණි. ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුම යටතේ ඉංදියාව වෙත කරන ලද මුළු අපනයනයන්හි වටිනාකම, ඇමෙරිකානු ඩොලර් මිලියන 5ක් වූ අතර ඒ සඳහා ස්වාභාවික රබර් අපනයන දායකත්වය ඇමෙරිකානු ඩොලර් මිලියන 4.8ක් විය.

## 6.2 දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)

දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) 1993 අප්‍රේල් මස 11 දින අත්සන් කරන ලදුව 1995 දෙසැම්බර් මස 07 දින සිට ක්‍රියාත්මක කරන ලදී. මෙම ගිවිසුම මගින් පිළිබිඹු වන ලද්දේ, සහන හුවමාරු කර ගැනීම තුළින් සාර්ක් කලාපය තුළ අන්‍යෝන්‍ය වෙළඳ හා ආර්ථික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙනයාම සඳහා සාමාජික රාජ්‍යයන්ගේ කැමැත්තයි.

මූලික වශයෙන් දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) හා ඉන් අනතුරුව රේගු සංගමය දෙසට යොමු වීමේ ප්‍රථම පියවර ලෙස දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) ආරම්භ කරන ලදී. එබැවින්, අනාගතයේදී දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම වෙනුවට ක්‍රමිකව දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම ආදේශ කිරීමට නියමිතය. ඒ අනුව, දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම යටතේ තීරුබදු වරණය භාවිතය ක්‍රමිකව අඩුවෙමින් පවතී. 2013 වර්ෂය තුළදී, ශ්‍රී ලංකාව විසින් දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම යටතේ ඉංදියාව, නේපාලය සහ පාකිස්ථානය වෙත ඇමෙරිකානු ඩොලර් මිලියන 2.2ක පමණ වටිනාකමින් යුතු භාණ්ඩ අපනයනය කරනු ලැබ ඇත. රේසින් රබර් ෂීට් (Resin Rubber Sheets), වල්කනයිස් කරන ලද රබර් (Vulcanized Rubber) සහ රබර් පටි (Latex Bands) සුළු ප්‍රමාණයක් දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම යටතේ අපනයනය කරන ලද නිෂ්පාදන වේ. පොල් තෙල්, මෙම ගිවිසුම යටතේ පාකිස්ථානය වෙත අපනයනය කරන ලද ප්‍රධාන නිෂ්පාදනය වේ. දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම යටතේ අපනයනය කරන ලද අනෙකුත් නිෂ්පාදන වන්නේ ස්වාභාවික රබර්, ඉවතලන හා අපතේ දමන කඩදාසිය.

## 6.3 දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)

දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) 2004 ජනවාරි මාසයේදී පාකිස්ථානයේ ඉස්ලාමාබාද්හිදී පැවැත්වූ 12 වන සාර්ක් සමුළුව අතර තුරදී අත්සන් කරන ලද අතර, 2006 ජනවාරි 01 දින සිට බලාත්මකව ක්‍රියාත්මක කරන ලදී. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ අරමුණ වන්නේ, 1995 වර්ෂයේ දී දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) ස්ථාපිත කිරීමත් සමඟ ඇරඹි වරණීය වෙළඳ ප්‍රවර්ධනය තුළින් කලාපීය ආර්ථික ඒකීයකරණ වැඩසටහන තවදුරටත් වැඩි දියුණු කිරීමයි.

සෑම සාමාජික රාජ්‍යයක් විසින්ම සංවේදී අයිතම ලැයිස්තු 20% කින් අඩුකිරීම පිළිබඳව ද සාකච්ඡා කරන ලදුව ඒවායෙහි කටයුතු අවසන් කර ඇත. ශ්‍රී ලංකාව විසින් මෙම බැඳීම 2013 නොවැම්බර් 21 සිට ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

2013 වර්ෂය තුළදී ශ්‍රී ලංකාව විසින් දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ඉන්දියාව, මාලදිවයින සහ නේපාලය වෙත ඇමෙරිකානු ඩොලර් මිලියන 1.74 ක් වටිනා භාණ්ඩ අපනයනය කරනු ලැබ ඇත. ඉන්දියාව වෙත අපනයනය කරන ලද ප්‍රධාන නිෂ්පාදන වන්නේ, හුක් ඇන්ඩ් ලූප් ෆාස්නර්ස් (Hook & loop fasteners), කෘත්‍රිම තනි සූත්‍රිකා (Synthetic Monofilaments), ස්වභාවික කොහු කෙඳි, මිනිරන් අපකිරණ සහ ලිහිසිකරණය (Graphite dispersions and Lubricating). මේස, ලියන මේස සහ පුටු ආදී ලී බඩු නිෂ්පාදන මෙම ගිවිසුම යටතේ මාලදිවයින වෙත අපනයනය කරනු ලැබ ඇත. බයිසිකල් ටයර් සහ ආලේපිත කැල්සියම් කාබනේට් සුළු ප්‍රමාණයක් දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ නේපාලය වෙත අපනයනය කරනු ලැබ ඇත.

2013 වර්ෂය තුළදී දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ පහත සඳහන් රැස්වීම් පවත්වන ලදී.

1. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සංවේදී අයිතම ලැයිස්තු අඩුකිරීම පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ දෙවන සභාවාරය (III වන අදියර), කත්මණ්ඩු, 2013 ජූලි 30.
2. තීරුබදු නොවන ක්‍රියාමාර්ග සහ පැරා තීරුබදු ක්‍රියාමාර්ග පිළිබඳ දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ විශේෂඥ කමිටුවේ විශේෂ සභාවාරය, කත්මණ්ඩු, 2013 ජූලි 31 සිට අගෝස්තු 01 දක්වා.
3. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ විශේෂඥ කමිටුවේ අටවැනි සභාවාරය, කොළඹ, 2013 අගෝස්තු 21 - 22.
4. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ අමාත්‍ය කවුන්සිලයේ හත්වැනි සභාවාරය, කොළඹ, 2013 අගෝස්තු 23.

ඉහත සඳහන් සභාවාරයන්හිදී පහත සඳහන් ගැටළු පිළිබඳව සාකච්ඡා කරන ලදී.

- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ අත්සන් තබන ලද ප්‍රතිශෝධිත සංවේදී අයිතම ලැයිස්තු නිකුත් කිරීම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය. (II වන අදියර)
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සංවේදී අයිතම ලැයිස්තු තවදුරටත් අඩුකිරීම සඳහා අනුගමනය කළ යුතු නියමයන් සහ කාල රාමුව. (III වන අදියර)
- සාමාජික රාජ්‍යයන් වෙතින් ලද තීරුබදු නොවන ක්‍රියාමාර්ග / පැරා - තීරුබදු ක්‍රියාමාර්ග පිළිබඳව සහ තීරුබදු නොවන ක්‍රියාමාර්ග / පැරා - තීරුබදු ක්‍රියාමාර්ගයන්ට අදාළ ගැටළු පිළිබඳව දැනුම්දීම් පරීක්ෂා කිරීම.
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සහ දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමෙන් පරිබාහිරව සාර්ක් කලාපය තුළ වෙළඳ ප්‍රවාහයන්ට අදාළ ගැටළු.
- යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය (EU GSP) යටතේ අධි කලාපීය සමුච්චිතය (Super Regional Cumulation), දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) සහ දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සත්‍යාපන යාන්ත්‍රණයක් (Verification Mechanism)

ආයතනීයකරණය කිරීම, දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ ආරවුල් විසඳීමේ යාන්ත්‍රණය සහ වෙළඳාම් පහසුකරණ වැඩසටහනට අදාළ ගැටළු.

- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම පරිපාලනය සහ ක්‍රියාත්මක කිරීමට අදාළ ගැටළු.

## 6.4 සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම (SATIS)

2010 අප්‍රේල් මාසයේදී භූතානයේදී පවත්වන ලද පසුගිය 16 වැනි සාර්ක් සමුළුව අතර තුරදී සාමාජික රාජ්‍යයන්ගේ නායකයින් විසින් සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම් කෙටුම්පත අත්සන් කරන ලදී. සියලුම රටවල් මෙම ගිවිසුම සඳහා එකඟතාව පළ කරන ලද අතර සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම (SATIS) යටතේ පවත්නා ජාතික බැඳීම් උපලේඛනවල කටයුතු අවසන් කිරීමේ ක්‍රියාවලියෙහි නිරතවන ලදී.

ඉන්දියාව සහ භූතානය විසින් ඔවුන්ගේ බැඳීම් උපලේඛන දැනටමත් ඉදිරිපත් කරනු ලැබ ඇත. ශ්‍රී ලංකාව විසින් බැඳීම් උපලේඛනයේ කටයුතු අවසන් කිරීමේ ක්‍රියාවලියෙහි නිරතවී සිටිනු ලැබේ.

## 6.5 ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (Indian Ocean Rim Association)

ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය යනු, ඉන්දියානු සාගර වටද්දර රටවල් අතර සහයෝගීතාව සහ සමීප අන්තර් ක්‍රියාකාරීත්වයන් ප්‍රවර්ධනය කිරීම සඳහා රජය, ව්‍යාපාරික කටයුතු සහ විද්වත් ප්‍රජාව යන ත්‍රෛ පාර්ශ්වයයන් එකට කැටුව එන, එම රටවල් අතර පිහිටුවා ගන්නා ලද කලාපීය සංසදයකි. ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ රටවල් සඳහා මුළු අපනයන ඇමෙරිකානු ඩොලර් මිලියන 1535.22 ක් වන අතර ඉන් 15% ක් ලෝකයේ රටවල් වෙත ශ්‍රී ලංකාවේ අපනයන වේ. 2013 වර්ෂයේදී සාගර වටද්දර රටවල සංවිධානයේ රටවල් වෙතින් කරන ලද මුළු ආනයන ඇමෙරිකානු ඩොලර් මිලියන 8044.54ක් වන අතර එය, ලෝකයේ රටවල් වෙතින් ශ්‍රී ලංකාව වෙත කරන ලද ආනයනයන්ගෙන් 47%කට සමාන වේ. මෙමගින්, සාගර වටද්දර රටවල සංවිධාන කලාපයේ ඇමෙරිකානු ඩොලර් මිලියන 6509.32ක සෘණාත්මක වෙළඳ ශේෂයක් සනිටුහන් කෙරේ. ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ රටවල් සමඟ ශ්‍රී ලංකාවේ මුළු වෙළඳාම ඇමෙරිකානු ඩොලර් මිලියන 9579.76ක් වන අතර එය, ලෝකයේ රටවල් සමඟ වෙළඳාමෙන් 35%ක් වේ.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය, ගරු. රිසාඩ් බදියුඩීන් මැතිතුමා විසින්, වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ ශ්‍රී ලාංකික සමාගම් පහක නියෝජිතවරුන් කැටුව 2013 ජූලි 4 - 5 දිනයන්හිදී මුරුසියේදී පැවති ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ (IORA) අමාත්‍ය මට්ටමේ පළමු ආර්ථික සහ ව්‍යාපාරික සමුළුවට සහභාගී වන ලදී. තවද, ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ ආර්ථික සහ ව්‍යාපාරික සමුළුව 2013 ජූලි 4 - 5 දිනයන්හිදී මුරුසියේදී පවත්වන ලදී. මෙය පවත්වන ලද්දේ, 2012 වර්ෂයේදී පැවති 18 වැනි ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ ව්‍යාපාරික සංසදයේදී එළඹි තීරණයක ප්‍රතිඵලයක් වශයෙනි. මෙම සමුළුවේ අරමුණ වූයේ, සාමාජික රටවල රාජ්‍ය අංශයේ ප්‍රතිපත්ති සැලසුම්කරුවන් සහ පෞද්ගලික අංශයේ ප්‍රධානීන් ඒකරාශී කිරීම මගින් වෙළඳ සබඳතා ශක්තිමත් කිරීම,

පෞද්ගලික අංශය අතර අන්තර් ක්‍රියාකාරීත්වය තුළින් වාණිජ සහයෝගීතාව පුළුල් කිරීම සහ B2B රැස්වීම් මගින් ව්‍යවසායකයින් සහ නිෂ්පාදන සංකලනය කිරීම සහ ගැලපීමයි.

ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ අමාත්‍ය සභාවේ 13 වැනි සභාවාරය 2013 ඔක්තෝබර් 30 සිට නොවැම්බර් 01 දක්වා ඕස්ට්‍රේලියාවේ පර්ත් හිදී පවත්වන ලදී. මෙම සභාවාරයේදී සාමාජික රාජ්‍යයන් අතර වරණීය වෙළඳ ගිවිසුමකට (PTA) සහභාගිවීම සඳහා ශ්‍රී ලංකාව විසින් සිය කැමැත්ත සහ අදහස් පළ කරන ලදී.

වෙළඳාම හා ආයෝජනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ (WGTI) රැස්වීම අතරතුරදී, සාමාජික රටවල් කිහිපයක් විසින් ඔවුන්ගේ නව ව්‍යාපෘති යෝජනා සහ දැනටමත් ක්‍රියාත්මක කරනු ලැබ ඇති ව්‍යාපෘතීන්හි යාවත්කාලීන කිරීම් ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකාව විසින්, ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ සාමාජික රටවල් අතර ව්‍යාපාරික සංචාරක කාඩ්පතක් (Business Travel Card) හඳුන්වාදීමේ සංකල්පය සඳහා සිය සහාය පළ කරන ලදී. තවද, ශ්‍රී ලංකාව විසින් " කලාපය තුළ වෙළඳාම සහ ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ සාමාජික රාජ්‍යයන් තුළ ආයෝජනය ප්‍රවර්ධනය කිරීම සඳහා වන සංස්ථායික යාන්ත්‍රණ පිළිබඳව අධ්‍යයනය කිරීම" පිළිබඳවද සැකෙවින් දක්වන ලද අතර ඉන්දියානු සාගර නිරීක්ෂණය සහ පුරෝකථනය සඳහා මධ්‍යස්ථානයක් පිහිටුවීමේ යෝජිත ව්‍යාපෘතිය සඳහා ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ විශේෂ අරමුදලින් අරමුදල් සම්පාදනය කරන ලෙස ඉල්ලා සිටින ලදී.

තවද, ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ සාමාජික රාජ්‍යයන් සඳහා 2014 මැයි මාසයේදී ශ්‍රී ලංකාවේදී පැවැත්වෙන "උරුමයන් කළමනාකරණය පිළිබඳ වැඩමුළුව" පිළිබඳව ද ශ්‍රී ලංකාව විසින් ප්‍රකාශයට පත්කරන ලදී. මෙම හමුවන් අතරතුරදී, ශ්‍රී ලංකාව විසින් සාමාජික රටවල බොහෝ ව්‍යාපෘති සඳහා සිය කැමැත්ත සහ සහාය පළ කරන ලදී.

## 7.0 වෙළඳ, ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධන

### 7.1 විදේශ වාණිජ නියෝජනය

විදේශ රටවල ස්ථාපිත ශ්‍රී ලංකා දූත මණ්ඩල 23ක නිලධාරීන් 25 දෙනෙකුගෙන් සමන්විත වාණිජ දෙපාර්තමේන්තුවේ වාණිජ නියෝජනය මගින් වෙළඳාම, ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය කෙරෙහි විශේෂ අවධාණය යොමු කරමින් සත්කාරක රටවල ශ්‍රී ලංකාවේ වාණිජ සහ ආර්ථික කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීමෙහිලා නිරතවන ලදී. "මහින්ද චින්තන ඉදිරි දැක්ම" සංකල්පයට අනුව යමින් ක්‍රියාත්මක වන "රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්ව වැඩසටහන" යටතේ වාණිජ නිලධාරීන් විසින් ක්‍රියාකාරකම් පුළුල් පරාසයක් ක්‍රියාවට නංවනු ලැබේ. ශ්‍රී ලාංකික අපනයන සඳහා ජාත්‍යන්තර වෙළඳපළ තවදුරටත් පුළුල් කිරීම සහ විවිධාංගීකරණය කිරීම සඳහා, විදේශ රටවල ස්ථාපිත ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවයෙහි යොදවා ඇති වාණිජ නිලධාරීන්ගේ සහ ශ්‍රී ලංකාවේ පිහිටි අනෙකුත් සහාය ව්‍යාපාරික සංවිධානවල සහයෝගය ඇතිව, වාණිජ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරකම් පෙළක් ක්‍රියාවට නංවන ලදී. නව අපනයන වෙළඳපළ හඳුන්වාදීම සහ පවත්නා වෙළඳපළවල වඩාත් යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීම තුළින් ජාත්‍යන්තර වෙළඳපළ තුළ ඔවුනගේ වෙළඳපළ කොටස පුළුල් කිරීම

සඳහා ප්‍රමුඛ අපනයනකරුවන් වෙත මූලික අවධානය යොමුකරන අතරතුර, වාණිජ නිලධාරීන් විසින් සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් වෙත ඔවුනගේ නිෂ්පාදන වෙනුවෙන් ජාත්‍යන්තර වෙළඳපළ ප්‍රවේශයක් ලබාගැනීම සඳහා අඛණ්ඩව සහයෝගය දක්වන ලදී.

විදේශයන්හි සිටින වාණිජ නිලධාරීන් විසින් ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

- ශ්‍රී ලාංකික නිෂ්පාදන සඳහා අපනයන අවස්ථාවන් හඳුනාගැනීම සඳහා වෙළඳපළ සමීක්ෂණ/ තොරතුරු සම්පාදනය කිරීම.
- සත්කාරක රටෙහි වෙළඳ ප්‍රතිපත්ති වෙනස්කම්, විශේෂයෙන් තීරුබදු සහ තීරුබදු නොවන ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම.
- වැදගත් ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන/අවස්ථා සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීම. මෙය, ශ්‍රී ලාංකික අපනයන ප්‍රවර්ධනය කිරීමෙහිලා වඩාත් ඵලදායී මෙවලමක් වශයෙන් සළකනු ලැබේ.
- ශ්‍රී ලංකාවේ පවත්වන ලද ප්‍රදර්ශන/අවස්ථා සඳහා විදේශීය ව්‍යාපාරික දූත පිරිස් සංවිධානය කිරීම.
- සත්කාරක රටවලදී ශ්‍රී ලංකා-විශේෂී (තනි-රට) ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම.
- ව්‍යාපාරික අවස්ථාවන් සොයාබැලීම සඳහා ශ්‍රී ලංකාවෙන් සහ ශ්‍රී ලංකාව වෙත වෙළඳ, ආයෝජන සහ සංචාරක දූත පිරිස් සංවිධානය කිරීම.
- ව්‍යාපාරික අවස්ථාවන් සොයාබැලීම සඳහා ශ්‍රී ලංකාවෙන් සහ ශ්‍රී ලංකාව වෙත පුද්ගල ව්‍යාපාරික සංචාරයන් සංවිධානය කිරීම.
- සත්කාරක රටවල වෙළඳ, ආයෝජන සහ සංචාරක ක්ෂේත්‍ර වලට අදාළ රජයේ නිලධාරීන් ජාලගත කිරීම සහ ශ්‍රී ලංකාවේ වාණිජ සහ ආර්ථික කටයුතු වලට අදාළ ගැටළු/ කරුණු සම්බන්ධයෙන් විවිධ රාජ්‍ය සහ ජාත්‍යන්තර සංවිධාන වලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම.
- වෙළඳ, ආයෝජන සහ සංචාරක ආශ්‍රිත වෙළඳ විමසුම් සම්බන්ධයෙන් සේවය සැපයීම, විදේශ ව්‍යාපාරිකයින් හමුවීම/ සාකච්ඡා පැවැත්වීම, ශ්‍රී ලාංකික අපනයනකරුවන් සඳහා තාක්ෂණික සහාය ලබාදීම සහ වෙළඳ ආරවුල් විසඳීම යනාදිය.

2010 ජනවාරි සිට 2013 දෙසැම්බර් දක්වා වාණිජ නිලධාරීන් විසින් සිදුකරන ලද මෙවැනි ආකාරයේ ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දැක්වේ.

**(වගු අංක 02)**

| ක්‍රියාකාරකම් | 2010 | | 2011 | | 2012 | | 2013 | | එකතුව (2010-2013) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රදර්ශන/ දූත පිරිස් සංඛ්‍යාව | සහභාගි වූවන්/ නියෝජිතයින් සංඛ්‍යාව | ප්‍රදර්ශන/ දූත පිරිස් සංඛ්‍යාව | සහභාගි වූවන්/ නියෝජිතයින් සංඛ්‍යාව | ප්‍රදර්ශන/ දූත පිරිස් සංඛ්‍යාව | සහභාගි වූවන්/ නියෝජිතයින් සංඛ්‍යාව | ප්‍රදර්ශන/ දූත පිරිස් සංඛ්‍යාව | සහභාගි වූවන්/ නියෝජිතයින් සංඛ්‍යාව | ප්‍රදර්ශන/ දූත පිරිස් සංඛ්‍යාව | සහභාගි වූවන්/ නියෝජිතයින් සංඛ්‍යාව |
| ප්‍රවර්ධන සල්පිල් සඳහා සත්කාරක රට වෙත ශ්‍රී ලංකාවෙන් සහභාගීත්වය | 52 | 510 | 59 | 671 | 80 | 728 | 75 | 848 | 266 | 2757 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රවර්ධන සල්පිල් සඳහා ශ්‍රී ලංකාව වෙත සත්කාරක රටෙහි සහභාගීත්වය | 12 | 47 | 26 | 90 | 29 | 122 | 37 | 325 | 104 | 584 |
| ශ්‍රී ලංකාවේ එක්ස්පෝ - 2012 සඳහා සහභාගිවූවන් | අදාල නොවේ | අදාල නොවේ | අදාල නොවේ | අදාල නොවේ | 1 | 1160 | අදාල නොවේ | අදාල නොවේ | 1 | 1160 |
| සත්කාරක රටවලදී ශ්‍රී ලංකා-විශේෂී (තනි-රට) ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම | 88 | අදාල නොවේ | 116 | අදාල නොවේ | 138 | අදාල නොවේ | 127 | අදාල නොවේ | 469 | අදාල නොවේ |
| ශ්‍රී ලංකාව වෙත දූත පිරිස් පැමිණීම (එක්ස්පෝ- 2012 සඳහා හැර) | 49 | 385 | 43 | 282 | 48 | 457 | 98 | 563 | 238 | 1687 |
| සත්කාරක රට වෙත සංචාරය කළ දූත පිරිස් | 41 | 437 | 61 | 436 | 54 | 455 | 70 | 600 | 226 | 1928 |
| සත්කාරක රට වෙත පුද්ගල සංචාරයන් | අදාල නොවේ | 147 | අදාල නොවේ | 174 | අදාල නොවේ | 181 | අදාල නොවේ | 201 | අදාල නොවේ | 703 |
| ශ්‍රී ලංකාව වෙත පුද්ගල සංචාරයන් | අදාල නොවේ | 147 | අදාල නොවේ | 139 | අදාල නොවේ | 194 | අදාල නොවේ | 270 | අදාල නොවේ | 750 |
| ද්වි මාර්ගික වෙළඳ විමර්ශන පිළිතුරු ලබාදීම | 1728 | | 1751 | | 1882 | | 2133 | | 7494 | |

## 7.2 "REFLECTION OF SRI LANKA" යන මැයෙන් වූ වෙළඳාම, සංචාරක ව්‍යාපාරය සහ ආයෝජනය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රදර්ශනය - 2013 නොවැම්බර් 13 සිට 17 දක්වා, කොළඹදී

තානාපති කාර්යාලවල වාණිජ අංශ නිලධාරීන් විසින්, ඔවුනව සේවයෙහි යොදවා ඇති අදාල රටවලදී "REFLECTION OF SRI LANKA" යන මැයෙන් වූ ප්‍රදර්ශනයට උපරිම ප්‍රචාරණයක් ලබාදීම සඳහා කටයුතු සංවිධානය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, සංවිධායකයින්ගේ සම්බන්ධීකරණය ඇතිව විදේශීය ප්‍රදර්ශකයින් සහ මාධ්‍යවේදීන් විශාල සංඛ්‍යාවක් සහ විදේශීය ගැනුම්කරුවන් සියගණනක් මෙම ප්‍රදර්ශනය සඳහා සහභාගි කරවීමට කටයුතු කරන ලදී.

## 7.3 දැයට කිරුල ජාතික සංවර්ධන ප්‍රදර්ශනය - 2013 සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ ප්‍රදර්ශන කුටිය

වාණිජ දෙපාර්තමේන්තුව විසින්, අම්පාරේදී පවත්වන ලද "දැයට කිරුල 2013" ජාතික සංවර්ධන ප්‍රදර්ශනය සඳහා සහභාගී වන ලදී. වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන කාර්යයන් සහ සේවාවන් පිළිබඳව මහජනතාව, සිසුන් සහ අපනයනකරුවන් දැනුවත් කිරීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ ප්‍රදර්ශන කුටියේදී තොරතුරු ඇතුළත් පොත් පිංචක් බෙදාදෙන ලද අතර විදේශ රටවල සේවයෙහි යොදවා ඇති වාණිජ නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය වීමට ඒ සඳහා උනන්දුවක් දක්වන ව්‍යාපාරකයින්ගේ යහපත උදෙසා වීඩියෝ විද්‍යුත් මාධ්‍ය සාකච්ඡා පහසුකම් ලබාදෙන ලදී.

### 7.4 දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

**(අ) එක්සත් ජනපදයේ ආහාර සහ ඖෂධ පරිපාලනයේ නව ආහාර ආරක්ෂණ නවීකරණ පනත (US Food and Drug Administration's new food safety modernization Act) සහ ආහාර සහ ඖෂධ පරිපාලනයේ (FDA's) පිරික්සුම් ක්‍රියාවලිය පිළිබඳ සම්මන්ත්‍රණය - 2013 අගෝස්තු 24**

වොෂින්ටනයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහයෝගය ඇතිව වාණිජ දෙපාර්තමේන්තුව විසින්, ඇමෙරිකා එක්සත් ජනපදයේ ආහාර සහ ඖෂධ පරිපාලනයේ සහ ආහාර කර්මාන්තයේ පෞද්ගලික අංශයේ විශේෂඥයෙකු සමඟ ශ්‍රී ලංකාවේ පවතින සහ විභව ආහාර සහ ආශ්‍රිත අපනයනකරුවන් සඳහා, සහභාගීවන්නන් 55 කින් යුතු, සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. මෙම සම්මන්ත්‍රණයේ අරමුණ වූයේ, ඇමෙරිකා එක්සත් ජනපදයේ ආහාර නවීකරණ පනත (Food Modernization Act of USA) සහ මෙම වර්ෂයේ අවසන් භාගය තුළදී ශ්‍රී ලංකාවේදී පවත්වනු ලබන ආහාර සහ ඖෂධ පරිපාලනයේ (FDA's) පිරික්සුම් ක්‍රියාවලිය පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීමයි.

**(ආ) නෝර්වේ GSP+ යෝජනාක්‍රමය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන - 2013 අගෝස්තු 08**

ලංකා වාණිජ මණ්ඩලයේ කාර්ය සංවිධාන සහයෝගය ඇතිව වාණිජ දෙපාර්තමේන්තුව විසින්, නව නෝර්වේ GSP+ යෝජනාක්‍රමය යටතේ නෝර්වේ රාජ්‍යය වෙත අපනයන පුළුල් කිරීම සඳහා වන ශක්‍යතාව පිළිබඳව, සහභාගීවන්නන් 50 කින් යුතු දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී.

### 7.5 සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම

සංචාරක ව්‍යාපාරය, රටෙහි පැවති ත්‍රස්තවාදය පරාජය කිරීමෙන් අනතුරුව ක්ෂණික අවධානයට ලක්වූ ක්ෂේත්‍ර වලින් එකක් විය. වෙළඳ නිලධාරීන් විසින් සංචාරක ක්ෂේත්‍රය තුළ පවත්නා සුවිශාල ශක්‍යතාවන් හඳුනාගනිමින්, ශ්‍රී ලංකාව ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශයේ සහ ශ්‍රී ලංකන් ගුවන් සේවයේ (Sri Lankan Airlines) සහාය ඇතිව විදේශ රටවල් තුළ විවිධ ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කරනු ලැබ ඇත. විශේෂ සංසද සහ සම්මේලන සංවිධානය කිරීම, සංචාරක කණ්ඩායම්වල සංචාරයන් සංවිධානය කිරීම, ශ්‍රී ලංකා ප්‍රවර්ධන අංගයන් සංවිධානය කිරීම, ජාත්‍යන්තර සංචාරක සල්පිල් වෙත සහභාගීවීම , ශ්‍රී ලංකාව වෙත මාධ්‍ය දූත පිරිස් සහ FAM සංචාරයන් සංවිධානය කිරීම, සංචාරක ප්‍රවර්ධන මණ්ඩල ස්ථාපිත කිරීම සහ සත්කාරක රටෙහි විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා ප්‍රසිද්ධියක් ලබාදීම, ශ්‍රී ලංකාව ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා වෙළඳ නිලධාරීන් විසින් අනුගමනය කරන ලද ප්‍රධාන ක්‍රමෝපායන්ට ඇතුළත් වේ.

### 7.6 සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය (FDI)

ශ්‍රී ලංකාව වෙත සෘජු විදේශ ආයෝජන ආකර්ශනය කරගැනීමෙහිලා, විදේශ රටවල සේවයෙහි යොදවා ඇති වෙළඳ නිලධාරීන් විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටුකිරීම අඛණ්ඩව සිදුකරන ලදී. වෙළඳ නිලධාරීන් විසින් සමාලෝචනයට බඳුන් කරන ලද කාල පරිච්ඡේදය තුළ, ඔවුන්ගේ අදාළ වෙළඳපළ තුළ

විභවතාවෙන් යුතු ආයෝජකයින් ලෙස හඳුනාගත් විදේශ සමාගම් සහ පුද්ගලයින් 100කට අධික සංඛ්‍යාවක් හමුවන ලද අතර රටෙහි පවත්නා ආයෝජන අවස්ථාවන් පිළිබඳව ඔවුන් වෙත විස්තර සපයාදෙන ලදී. කර්මාන්තශාලා පිහිටුවීමට ඇති ශක්‍යතාවන් අධ්‍යයනය කිරීම සඳහා මෙම පාර්ශ්වයන්ගෙන් කිහිපදෙනෙකු දැනටමත් ශ්‍රී ලංකාව වෙත පැමිණ ඇත.

### 7.7 නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදීම

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙනුවෙන් වාණිජ අධ්‍යක්ෂ ජෙනරාල් විසින්, ශ්‍රී ලංකාවේ පිහිටි සමාගම්වල / ව්‍යාපාරික ආයතනවල සේවයේ නියුතු විදේශකයින් සඳහා නේවාසික වීසා බලපත්‍ර නිකුත්කිරීම සඳහා ආගමන හා විගමන පාලක වෙත නිර්දේශ ලිපි නිකුත්කරනු ලැබේ. මෙම කර්තව්‍ය ඉටුකිරීමේදී, වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත වීසා බලපත්‍ර අව්‍යාජ වූ බවට සහතිකකිරීම පිළිබඳව අතිරේක අවධානයක් යොමු කරන ලද අතර, ජාතික සංවර්ධනයට මෙන්ම මානව සම්පත් සංවර්ධනය සඳහාද සිය සහාය පළ කරන ලදී.

වර්ෂය තුළදී, වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉන්දියානු ජාතිකයින් 70ක්, බ්‍රිතාන්‍ය ජාතිකයින් 50ක්, ජපන් ජාතිකයින් 27ක්, පාකිස්ථාන ජාතිකයින් 17ක් යනාදී වශයෙන් විවිධ ජාතීන්ගෙන් සහ ඕස්ට්‍රියානු, ඕස්ට්‍රේලියානු, චීන, ප්‍රංශ, ජර්මන්, අයර්ලන්ත, කොරියානු, සිංගප්පූරු සහ ස්වීඩන් යනාදී අනෙකුත් ජාතීන්ගෙන් අයදුම්කරුවන් 115 දෙනෙකුගෙන් සහ යැපෙන්නන් 91 දෙනෙකුගෙන් සමන්විත විගමණිකයන් 206 දෙනෙකු සඳහා නේවාසික වීසා බලපත්‍ර නිර්දේශ නිකුත් කරනු ලැබ ඇත.

### 7.8 1949 අංක 06 දරන උකස් පනත යටතේ ණයදෙන ආයතන අනුමත කිරීම

1949 අංක 06 දරන උකස් පනත යටතේ, ඕනෑම සමාගමක්, වෙළඳ සමාගමක්, ආයතනයක් හෝ පුද්ගලයකු අනුමත කරන ලද ණය දෙන ආයතනයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමට වාණිජ අධ්‍යක්ෂ ජනරාල් වෙත බලය පවරා ඇත. අධ්‍යක්ෂ ජනරාල්වරයා එසේ සිය අනුමැතිය දෙනු ලබන්නේ, 1949 අංක 06 දරන උකස් පනතේ 114 (1) වන වගන්තිය යටතේ ගරු. අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සභාපතිවරයකුගෙන් හා තවත් පුද්ගලයින් දෙදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක නිර්දේශ මත පදනම්ව වේ.

## 8.0 ප්‍රභවස්ථාන සහතික නිකුත්කිරීම

පහත සඳහන් වරණීය ගිවිසුම් සහ කලාපීය, ද්විපාර්ශ්වික සහ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයනය කරනු ලබන ශ්‍රී ලාංකික සම්භවීය නිෂ්පාදන සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතික (COOs) නිකුත්කරනු ලබයි.

- වරණීය පොදු ක්‍රමය (GSP)
- ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)
- සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)
- දකුණු-ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)

- ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
- පාකිස්ථානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
- ආසියානු-පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA)

2013 දෙසැම්බර් 31 වන විට, වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතික (COOs) නිකුත් කිරීම සඳහා අපනයනකරුවන් 4,186 දෙනෙකු ලියාපදිංචි කරනු ලැබ ඇත. සාමාන්‍ය වැඩකරන දිනයකදී, වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතික 470 ක් සම්බන්ධයෙන් කටයුතු කරන ලදුව නිකුත් කරනු ලැබ ඇත. 2010 සිට 2013 දක්වා කාලය තුළ වාණිජ දෙපාර්තමේන්තුව විසින් අදාළ වරණීය වෙළඳ ගිවිසුම් යටතේ නිකුත් කරන ලද ප්රභවස්ථාන සහතික සංඛ්‍යාව වගු අංක 03 මගින් පෙන්නුම් කෙරේ. පූර්ව දැනුම්දීමකින් තොරව රාජකාරි වේලාව තුළ ඕනෑම අවස්ථාවක හමුවිය හැකි පූර්ණකාලීනව ප්‍රභවස්ථාන සහතික අංශය වෙත අනුයුක්තව කටයුතුකරන, ඉතා ඉහළ මට්ටමින් අභිප්‍රේරණය කරන ලද නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායමක් උපදෙස් ලබා දීම සඳහාත්, වැඩිදුර තොරතුරු පැහැදිලිකර දීම සඳහාත් සූදානම්ව සිටියි. සාමාන්‍යයෙන්, පත්කර ඇති නිලධාරීන් විසින් අපනයනකරුවන් 30 - 50 දෙනෙකුට දිනපතා උපදෙස් ලබා දෙනු ලැබේ. ප්‍රභවස්ථාන සහතික (COOs) නිකුත් කිරීම, විවිධ වෙළඳ ගිවිසුම් යටතේ අදාළ ප්‍රභවස්ථාන රීති නිර්ණායකය පිළිබඳව ගැඹුරු දැනුමක් ලබාගැනීම යනු අවශ්‍යවන ඉතා විශේෂිත කාර්යයක් වේ. මේ සම්බන්ධයෙන් වාණිජ දෙපාර්තමේන්තුවේ වගකීම් වන්නේ; (අ) තීරුබදු සහන සඳහා නිෂ්පාදනයක යෝග්‍යතාව තක්සේරු කිරීම, (ආ) අපනයනකරුවන්ගේ තොරතුරු සටහන් (profiles) ලියාපදිංචි කිරීම සහ පවත්වාගෙන යාම, (ඇ) පිරිවැය ප්‍රකාශයන් සහ යෝග්‍යතාව සපුරාලීම සඳහා අපනයනකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අනෙකුත් ආධාරක ලිපිලේඛන ඇගයුමට ලක්කිරීම, (ඈ) වරණය ලබාදෙන්නාවූ රටවල ඉල්ලීම මත ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීමෙන් පසු විගණන පැවැත්වීම සහ (ඉ) ප්‍රභවස්ථාන සහතික ආශ්‍රිත දත්ත සහ විශ්ලේෂණාත්මක වාර්තා සකස් කිරීම.

<u>වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතික</u>

**(වගු අංක 03)**

| ගිවිසුම | නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතික සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013 |
| යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය | 88,409 | 85,600 | 114,029 | 79,774 |
| වරණීය පොදු ක්‍රමය - අනෙකුත් රටවල් | 15,434 | 14,782 | 13,909 | 13,410 |
| වරණීය පොදු ක්‍රමය - පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රටවල් | 871 | 856 | 1,009 | 929 |
| ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම | 10,373 | 35 | 9,742 | 11,088 |

| | | | | |
|---|---|---|---|---|
| පාකිස්ථානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම | 5,219 | 30 | 8,057 | 8,190 |
| ආසියානු පැසිෆික් වෙළඳ ගිවිසුම | 1,906 | 2,424 | 2,781 | 3,482 |
| දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම | - | - | 26 | 74 |
| දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම | 239 | 248 | 253 | 243 |
| ගෝලීය වෙළඳ වරණ ක්‍රමය | 99 | 115 | 136 | 147 |
| එකතුව | **122,550** | **104,090** | **149,942** | **117,337** |

## වාණිජ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල සංචලන - 2013

| නිලධාරියාගේ නම | සංචලනය | දිනය |
|---|---|---|
| *උසස්වීම* | | |
| ආර්. ඩී. එස්. කුමාරරත්න මහතා,<br>වාණිජ අධ්‍යක්ෂ ජෙනරාල් | වාණිජ අධ්‍යක්ෂ ජෙනරාල් වශයෙන් රාජකාරි භාරගන්නා ලදී. | 03.10.2013 |
| *විශ්‍රාම ගැනීම* | | |
| පී.ඩී. ප්‍රනාන්දු මහතා,<br>වාණිජ අධ්‍යක්ෂ ජෙනරාල් | වාණිජ අධ්‍යක්ෂ ජෙනරාල් තනතුරෙන් විශ්‍රාම ගන්නා ලදී. | 21.09.2013 |
| *නව බඳවාගැනීම්* | | |
| වී. එස්. බණ්ඩාර මහත්මිය | සහකාර වාණිජ අධ්‍යක්ෂ වශයෙන් බඳවාගන්නා ලදී. | 06.02.2013 |
| පී. කේ. එස්. ජයරත්න මෙනවිය | සහකාර වාණිජ අධ්‍යක්ෂ වශයෙන් බඳවාගන්නා ලදී. | 06.02.2013 |
| ඩබ්. ජී. වයි. එන්. ගුණවර්ධන මෙනවිය | සහකාර වාණිජ අධ්‍යක්ෂ වශයෙන් බඳවාගන්නා ලදී. | 06.02.2013 |
| ඩී. එම්. එස්. එන්. අබේරත්න මෙනවිය | සහකාර වාණිජ අධ්‍යක්ෂ වශයෙන් බඳවාගන්නා ලදී. | 06.02.2013 |
| ඩබ්. සී.කේ. පෙරේරා මෙනවිය | සහකාර වාණිජ අධ්‍යක්ෂ වශයෙන් බඳවාගන්නා ලදී. | 06.02.2013 |
| එම්. ඩබ්. බී. අබේකෝන් මෙනවිය | සහකාර වාණිජ අධ්‍යක්ෂ වශයෙන් බඳවාගන්නා ලදී. | 06.02.2013 |
| ඩබ්. ටී. සී. බොතේජු මෙනවිය | සහකාර වාණිජ අධ්‍යක්ෂ වශයෙන් බඳවාගන්නා ලදී. | 06.02.2013 |
| එස්. ඒ. එස්. ඒ. සමරවීර මහතා | සහකාර වාණිජ අධ්‍යක්ෂ වශයෙන් බඳවාගන්නා ලදී. | 06.02.2013 |
| එම්. ජී. කේ. ජේ. කුමාර මහතා | සහකාර වාණිජ අධ්‍යක්ෂ වශයෙන් බඳවාගන්නා ලදී. | 06.02.2013 |
| ආර්. පී. ජී. ආර්. රාජපක්ෂ මහතා | සහකාර වාණිජ අධ්‍යක්ෂ වශයෙන් බඳවාගන්නා ලදී. | 06.02.2013 |
| **සේවා ස්ථාන මාරුවීම් – පත්කිරීම්** | | |
| ඒ. ජී. එන්. ඒ. කරුණාතිලක මහතා,<br>වාණිජ අධ්‍යක්ෂ | ලෝක වෙළඳ සංවිධානය සහ ස්විට්සර්ලන්තයේ ජිනීවාහි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත ස්ථිර නියෝජිත වශයෙන් පත් කරන ලදී. | 01.01.2013 |
| ඩී. ඒ. එස්. විජේවන්ත මහත්මිය,<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | එක්සත් රාජධානියේ ලන්ඩන් හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය වෙත පත් කරන ලදී. | 01.01.2013 |
| ඩී.එම්. රත්නායක මහතා,<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | ඕස්ට්‍රේලියාවේ සිඩ්නි හි පිහිටි ශ්‍රී ලංකා කොන්සියුලර් ජෙනරාල් කාර්යාලය වෙත පත් කරන ලදී. | 19.03.2013 |

| | | |
|---|---|---|
| ඩී.එම්. එන්. පී. විජේරත්න මහතා,<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | ලෝක වෙළඳ සංවිධාන කාර්යාලය සහ ස්විට්සර්ලන්තයේ ජිනීවාහි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත ස්ථිර නියෝජිත වශයෙන් පත් කරන ලදී. | 09.09.2013 |
| එච්. එම්. බී. හේරත් මහතා,<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | පාකිස්ථානයේ කරච්චි හි පිහිටි ශ්‍රී ලංකා කොන්සියුලර් ජෙනරාල් කාර්යාලය වෙත පත් කරන ලදී. | 14.09.2013 |
| බී. එම්. එස්. ඒ. බී. ගොඩවිට මහතා,<br>වාණිජ අධ්‍යක්ෂ | කැනඩාවේ ටොරොන්ටෝ හි පිහිටි ශ්‍රී ලංකා කොන්සියුලර් ජෙනරාල් කාර්යාලය වෙත පත් කරන ලදී. | 16.09.2013 |
| වයි. වයි. කේ. ද සිල්වා මහතා,<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | දකුණු කොරියාවේ සියොල් හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත පත් කරන ලදී. | 25.10.2013 |
| ඩී.ඩී. ප්‍රේමරත්න මහතා,<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | ජපානයේ ටෝකියෝ හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත පත් කරන ලදී. | 21.12.2013 |
| **සේවා ස්ථාන මාරුවීම් – ආපසු පැමිණීම්** | | |
| ඩී. ඩබ්. ජිනදාස මහතා,<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | පාකිස්ථානයේ කරච්චි හි පිහිටි ශ්‍රී ලංකා කොන්සියුලර් ජෙනරාල් කාර්යාලයේ සිට ශ්‍රී ලංකාව වෙත ආපසු පැමිණෙන ලදී. | 01.08.2013 |
| එල්. පී. පීරිස් මහත්මිය,<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | ලෝක වෙළඳ සංවිධාන කාර්යාලයේ සහ ස්විට්සර්ලන්තයේ ජිනීවාහි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ස්ථිර නියෝජිත වශයෙන් සිට ශ්‍රී ලංකාව වෙත ආපසු පැමිණෙන ලදී. | 11.08.2013 |
| ආර්. ඩී. එස්. කුමාරරත්න මහතා,<br>වාණිජ අධ්‍යක්ෂ | බෙල්ජියමේ බ්‍රසල්ස් හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සිට ශ්‍රී ලංකාව වෙත ආපසු පැමිණෙන ලදී. | 20.09.2013 |
| ඩී. ජී. ඒ. පී. ධර්මප්‍රිය මහතා,<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | සිංගප්පූරුවේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සිට ශ්‍රී ලංකාව වෙත ආපසු පැමිණෙන ලදී. | 26.08.2013 |
| එච්. එම්. බී. හේරත් මහතා,<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | කැනඩාවේ ටොරොන්ටෝ හි පිහිටි ශ්‍රී ලංකා කොන්සියුලර් ජෙනරාල් කාර්යාලයේ සිට ශ්‍රී ලංකාව වෙත ආපසු පැමිණෙන ලද අතර පාකිස්ථානයේ කරච්චි හි පිහිටි ශ්‍රී ලංකා කොන්සියුලර් ජෙනරාල් කාර්යාලය වෙත පත් කරන ලදී. | 13.09.2013 |
| එස්. එම්. සී. ඩී. යටෝගොඩ මහතා,<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | දකුණු කොරියාවේ සියොල් හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සිට ශ්‍රී ලංකාව වෙත ආපසු පැමිණෙන ලදී. | 30.09.2013 |

| | | |
|---|---|---|
| ඉසඩ්. ඒ. එම්. ෂාෆි මහත්මිය,<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | මැලේසියාවේ ක්වාලා ලම්පූර් හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සිට ශ්‍රී ලංකාව වෙත ආපසු පැමිණෙන ලදී. | 01.10.2013 |
| එම්. සෝමසේන මහතා,<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | ජපානයේ ටෝකියෝ හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සිට ශ්‍රී ලංකාව වෙත ආපසු පැමිණෙන ලදී. | 31.12.2013 |

## ANNUAL ACCOUNTS:

ශීර්ෂ අංකය/த லபப இல /Head No:295

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව:- වාණිජ දෙපාර්තමේන්තුව

அ மசச/தணககளம -வரததகதத ணககளம

Ministry/Department:-Department of Commerce

වැඩසටහන් අංකය/ந கமசச ததடட இல/ Programme No:01

ව්‍යාපෘතිය 1/க ரதத டட இல/Project 1

පුනරාවර්තන වියදම්/மண வ ரம சலவ/Recurrent Expenditure

| විස්තරය<br>வ வரணம<br>Description | 2012<br>සත්‍ය<br>වියදම<br>Actual<br>Rs. | 2013<br>අනුමත<br>ඇස්තමේන්තුව<br>Actual<br>Rs. | 2013<br>සංශෝධිත<br>ඇස්තමේන්තුව<br>Revised<br>Estimate<br>Rs. | 2013<br>සත්‍ය වියදම<br>Actual<br>Rs. | ඉතිරිය<br>Savings<br>Rs. |
|---|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි<br>ஆளககரய வதன தகள<br>Personal Emoluments | 26,823,235 | 34,750,000 | 32,950,000 | 31,015,639 | 1,934,361 |
| වෙනත්<br>ஏ னயவகள<br>Other | 54,490,223 | 61,226,000 | 63,026,000 | 61,624,657 | 1,401,343 |
| මුළු වියදම් පුනරාවර්තන<br>එකතුව/ ம ததம/Total | **81,313,458** | **95,976,000** | **95,976,000** | **92,640,296** | **3,335,704** |

## ANNUAL ACCOUNTS:

| මූලධන වියදම් Capital Expenditure | | | | | |
|---|---|---|---|---|---|
| වැය විෂය අංකය / විස්තර | ('000) සත්‍ය වියදම Actual (2012) | ('000) අනුමත ඇස්තමේන්තු Estimate (2013) | ('000) සංශෝධිත ඇස්තමේන්තු Revised Estimate (2013) | ('000) සත්‍ය වියදම Actual (2013) | ඉතිරිය Savings (2013) |
| **මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරීම**<br>**Rehabilitation & improvement of Capital Assets** | **433** | **600** | **600** | **111** | **489** |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ (2002)<br>Plant Machinery & Equipment | 299 | 400 | 400 | 20 | 380 |
| වාහන (2003)<br>Vehicles | 134 | 200 | 200 | 91 | 109 |
| **මූලධන වත්කම් අත්පත් කර ගැනීම**<br>**Acquisition of Capital Assets** | **828** | **3325** | **4325** | **4050** | **275** |
| වාහන (2101)<br>Vehicles | 0 | 300 | 300 | 150 | 150 |
| ලී බඩු හා කාර්යාලයීය උපකරණ(2102)<br>Furniture & Office Equipment | 780 | 2725 | 3725 | 3665 | 60 |
| යන්ත්‍රෝපකරණ (2103)<br>Machinery | 48 | 300 | 300 | 235 | 65 |
| **මානව සම්පත් සංවර්ධනය**<br>**Human Resource Development** | **322** | **500** | **500** | **212** | **288** |
| කාර්ය මණ්ඩල පුහුණු (2401)<br>Staff Training | 322 | 500 | 500 | 212 | 288 |
| **වෙනත් මූලධන වියදම්**<br>**Other Capital Expenditure** | **5420** | **7000** | **6000** | **4595** | **1405** |
| ආයෝජන (2502)<br>Investments | 5420 | 7000 | 6000 | 4595 | 1405 |
| එකතුව/ **Total** | **7003** | **11425** | **11425** | **8968** | **2457** |